සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | පැය / மணித்தியாலம் / Hours |
|---|---|---|---|
| 13 | ආර්ථික විද්‍යාව | II | 03 |

**උපදෙස් :**

* "අ" කොටසින් අවම ප්‍රශ්න 2 ක්ද "ආ" කොටසින් අවම ප්‍රශ්න 2 ක්ද තෝරා, සම්පූර්ණ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## " අ " කොටස

(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 2ක් තෝර ගන්න)

01. කුඩා ඉඩමක හිමිකරුවන ගොවියෙකු සතුව පොල් ගස් කිහිපයක් ඇති අතර ඔහු පොල්තෙල් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. ඒ සඳහා ඔහු කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගනී. කෙසේ වෙතත්, පොල් ප්‍රමාණය සහ සේවකයින් සංඛ්‍යාව සීමිතය. පොල් වෙළඳපොලේ විකිණිය යුතුද නැතහොත් ඒවායින් පොල්තෙල් නිෂ්පාදනය කළ යුතුද යන්න ගොවියා තීරණය කළ යුතුය. අවසානයේ ඔහු පොල් විකිණීම වෙනුවට පොල්තෙල් නිෂ්පාදනය කිරීමට තීරණය කරයි.

(i) ඉහත සිදුවීම ඇසුරින් හිඟකම, තේරීම, ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් සහ අවස්ථික පිරිවැය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "යම් භාණ්ඩයක් නිෂ්පාදනය වැඩි කරන විට එහි ආවස්ථික පිරිවැය ඉහළ යයි." නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සහ එම වක්‍රයේ හැඩයට බලපාන හේතු ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4යි)

(iii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතයෙන් පහත සිදුවීම් පැහැදිලි කරන්න.
(අ) ශ්‍රී ලංකා ආර්ථිකයට "දිට්වා" සුළි කුණාටුවෙන් ඇතිවූ බලපෑම.
(ආ) මැදපෙරදිග යුද ගැටුම් ශ්‍රී ලංකාවට බලපාන ආකාරය.
(ඇ) ශ්‍රී ලංකාවේ තේ සඳහා පවතින ඉල්ලුම අඩුවීම.
(ඇ) කෘෂි කාර්මික අංශය සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිත කිරීම. (ලකුණු 4යි)

(iv) "වෙළඳපොළ ආර්ථික පද්ධතියක ගාමක බලවේගයක් වන්නේ ස්වාර්ථයයි" උදාහරණයක් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 02)

(v) විධාන ආර්ථික පද්ධතියක පවතින අවාසි මොනවාද ? (ලකුණු 02)

(vi) නූතන ආර්ථික පද්ධතිය තුළ සමාජ ප්‍රාග්ධනයේ කාර්ය භාරය කුමක්ද ? (ලකුණු 02)

2. (i) පෙට්‍රල්වල මිල වැඩි වුවද, ඒ සඳහා ඇති ඉල්ලුම අඩු නොවිණි. හේතුව පහදන්න. (ලකුණු 02)

(ii) පෙට්‍රල්වල මිල වෙනස්වන ප්‍රතිශතාත්මක වෙනසට සමානව හෝ ඊට වඩා වැඩියෙන්, ඒ සඳහා ඇති සැපයුම වෙනස් නොවීමට හේතු මොනවාද? (ලකුණු 04)

(iii) අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම වැඩි වුවද, එහි වෙළඳපොළ මිල පහත වැටී ඇත. මෙම වෙළඳපොළ තත්වය ප්‍රාස්ථාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) දෙන ලද අවස්ථාවකදී , අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට, y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය හෝ ඉල්ලුම, Y භාණ්ඩයේ මිලෙහි (Py) හෝ පාරිභෝගික ආදායමෙහි (Y) හෝ X භාණ්ඩයේ මිලෙහි (Px) හෝ වෙනස් වීමට දක්වන ලද ප්‍රතිචාරය පහත පරිදි වේ.

| Px | Y | Py | D/Qdy |
|---|---|---|---|
| රු. | රු. "000" | රු. | "ඒකක" |
| 24 | 50 | 40 | 200 |
| 30 | 200 | 32 | 300 |

y භාණ්ඩයේ ලක්ෂණ තුනක් ලියා දක්වන්න (ලකුණු 3)

(v) කල්පිත වෙළඳ පොළක අලෙවි වන කල්පිත භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

මිල ඉල්ලුම් සමීකරණය = Pd = 12- 1/9 Q

අධි ඉල්ලුම් සමීකරණය = Ex • D = 120 – 12P

(අ) වෙළඳපොළ සමතුලිතය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) සමතුලිතය ප්‍රස්ථාරිකව දක්වන්න. (ලකුණු 3)

(ඇ) සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය සහ පාරිභෝගිකයා ගෙවීමට කැමති වියදම ගණනය කරන්න. (ලකුණු 2)

3. (i) යම්කිසි භාණ්ඩයකට සැපයුම්කරු වෙත ඒකක බද්ධක් පැනවීමේදී, මිල සැපයුම් නම්‍යතාවය අනුව සමාජ සුභසාධනයට වන බලපෑම ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) “රජය නැවතත් ඉන්ධන වෙළඳපොළ සඳහා QR ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.” මෙහි ආර්ථික ප්‍රතිවිපාක ප්‍රස්තාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) 'පවතින මැදපෙරදිග යුධ තත්වය නිසා, ආනයනික භාණ්ඩවල සහ ආනයනි අමුද්‍රව්‍ය භාවිතයෙන් නිපදවන භාණ්ඩවල මිල ගණන් වැඩිවුනි.' මෙම භාණ්ඩවල මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා ඔබගේ යෝජනා මොනවාද? (ලකුණු 2යි)

(iv) තරඟකාරී වෙළඳ පොළක අලවිවන භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත:

* Qd = 27 - 3p (ඉල්ලුම් සමීකරණය)
* Qs = -5 + 5p (සැපයුම් සමීකරණය)

රජය විසින් රු. 1.60 ක ඒකක බද්දක් පනවන්නේ නම්, පහත දෑ ගණනය කරන්න.

(අ) සමතුලිතයට වන බදු බලපෑම. (ආ) නිෂ්පාදන අතිරික්තයට වන බලපෑම.

(ඇ) පාරිභෝගික අතිරික්තයට වන බලපෑම. (ඈ) ආර්ථික අතිරික්තයට වන බලපෑම.

(ඉ) අහිමි වූ ආර්ථික සුභසාධනය. (2 x 5 = ලකුණු 10යි)

4. (i) සචිනි 'රවිනි' සමාගමේ මෘදුකාංග ඉංජිනේරුවරියක ලෙස සේවය කරමින් රු. 80,000 ක මාසික වැටුපක් ලබයි. ඇය රැකියාවෙන් ඉල්ලා අස්වී, වාර්ෂිකව 10% ක පොලියක් ලැබෙන ඇයගේ රු. 500 000 ක ඉතුරුම් ප්‍රාග්ධනය ලෙස යොදාගෙන “බිනුරි” නමින් සපත්තු නිෂ්පාදන ආයතනයක් ආරම්භ කිරීමට තීරණය කරයි. ඇය රු. 30 000 බැගින් වූ මාසික වැටුප් සේවකයින් 4 දෙනෙකු යොදවා බඳවා ගනී. ඇයගේ සමාගමේ මාසික පිරිවැය පහත පරිදි වේ:

* අමුද්‍රව්‍ය රු. 100 000
* විදුලිය රු. 5 000
* ගොඩනැගිලි කුලිය රු. 20 000
* ප්‍රවාහනය: රු. 10,000

සචිනි රු. 5,000 බැගින් සපත්තු 100ක් විකිණීමට අපේක්ෂා කරන අතර අවම වශයෙන් රු. 80,000ක මාසික ලාභයක් බලාපොරොත්තු වේ.

පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) සෘජු පිරිවැය සහ වක්‍ර පිරිවැය. (ආ) ආර්ථික ලාභය සහ ගිණුම්කරණ ලාභය. (ලකුණු 4)

(ii) ආන්තික පිරිවැය )MC) සහ සාමාන්‍ය පිරිවැය )AC) වක්‍ර අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්නකෙටි . කාලීන නිෂ්පාදනයේදී මෙම වක්‍ර'U' හැඩයක් ගැනීමට හේතුව කුමක්ද? (ලකුණු 04)

(iii) පරිමාණානුකූල පිරිමැසුම් සහ පරිමාණානුකූල නොපිරිමැසුම් ඇති වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 04)

(iv) පූර්ණ තරඟකාරී ආයතනයක් “මිල ගනුවකු” ලෙස ක්‍රියා කළ යුත්තේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(v) ඒකාධිකාරී වෙළඳපොළ සහ ඒකාධිකාරී තරඟකාරී වෙළඳපොළ අතර වෙනස්කම් මොනවාද? (ලකුණු 02)

(vi) ආර්ථික බදු කුලිය සහ සංක්‍රාම ඉපයීම සාධක සැපයුම් නම්‍යතාවය මත රඳා පවතී සුදුසු රූප .සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

5. (i) මූලික ප්‍රවේශයන් තුන ඔස්සේ ජාතික ගිණුම් සැකසීමේ දී නිෂ්පාදිතයේ අගය සමාන වන්නේ ඇයි? (ලකුණු 4)

(ii) කල්පිත ආර්ථිකයක් සඳහා වන පහත සඳහන් දත්ත උපයෝගී කර ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (රු. මිලියන)

| | | | |
|---|---|---|---|
| * පුද්ගලික පරිභෝජන වියදම (C) | = 2400 | * තොග වෙනස් වීම | = 560 |
| * දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | = 1200 | * වටිනාකම් වෙනස්වීම් මත ආයෝජන | = 450 |
| * රජයේ මිලදී ගැනීම් (G) | = 2200 | * අපනයන (X) | = 400 |
| * ආනයන (M) | = 600 | * ශුද්ධ වක්‍ර බදු | =150 |

(ලකුණු 4)

(iii) "දළ දේශීය නිෂ්පාදිතය සහ දළ දේශීය වියදම යනු එකම සංකල්පයකි". විමසන්න. (ලකුණු 4)

(iv) රජයේ මැදිහත් වීම සහිත ආවෘත ආර්ථිකයක පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

ඉතුරුම් ශ්‍රිතය S = -2000 + 0.2Yd    ආයෝජනය I = 400
රජයේ මිලදී ගැනීම් G = 160    ස්වාධීන බදු T = 100

(අ) පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කර, ආදායම රු. 10,000 දී පරිභෝජන වියදම සොයන්න. (ලකුණු 2)

(ආ) සමතුලිත ජාතික ආදායම සොයන්න. (ලකුණු 2)

(ඇ) සමතුලිත නිමැවුම් මට්ටමේදී විදීම් සහ කාන්දු වීම් සමාන බව ඔප්පු කරන්න. (ලකුණු 2)

(v) තුලිත අයවැය ගුණකය යනු කුමක්ද? (ලකුණු 2)

## " ආ" කොටස
(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 2ක් තෝරා ගන්න)

6. (i) මුදලේ බාහිර අගය නිර්වචනය කර එය පොදු මිල මට්ටම හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) සරල විනිමය සමීකරණය යනු ගණිතමය ප්‍රකාශනයකි. එය මත පදනම්ව මුදල් ප්‍රමානවාදී න්‍යාය ගොඩනැගිනි. පහදන්න. (ලකුණු 4)

(iii) පදනම් මුදල්, මුදල් සැපයුම අතර ධන හා ගුණන සබඳතාවයක් ඇත. පහදන්න. (ලකුණු 4)

(iv) වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහතින් දක්වා ඇත. පැහැදිලි කරන්න.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු - | රු. 50 000 | සංචිත | - රු. 8 000 |
| ප්‍රාග්ධනය - | රු. 10 000 | ණය | - රු. 38 000 |
| | | ස්ථාවර වත්කම් | - රු. 4 000 |
| මුළු වගකීම් | රු. 60 000 | මුළු වත්කම් | රු. 60 000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, බැංකු පද්ධතියේ අධි සංචිත ශූන්‍යවන විට, මුදල් සැපයුමේ වෙනස ගණනය කරන්න. (ලකුණු 4)

(v) මහ බැංකුවේ අරමුණ ලඟා කර ගැනීම සඳහා විවට වෙළඳපොළ කටයුතු භාවිතා කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

7. (i) මිල යාන්ත්‍රණය මඟින් ආර්ථික කාර්යක්ෂමතාවය සඳහා මග පෙන්වීම් කරනු ලබන ආකාරයත්, එය දිරිමත් කරනු ලබන ආකාරයත් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) බදු ආපාතය සහ ඕනෑම බදු මූලධර්මයක් අතර ඇති සම්බන්දතාවය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ඉහළ ආදායම් ලබන කුටුම්භ ඉලක්ක කර, ආදායම් බදු අනුපාතය ඉහළ දැමීමේ සාර්ව ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 4)

(iv) "චක්‍රීය රාජ්‍ය මූල්‍ය හිඟයට වඩා ව්‍යුහාත්මක රාජ්‍ය මූල්‍ය හිඟය භයානක වේ." පහදන්න. (ලකුණු 4)

(v) ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 4)

8. (i) සාපේක්ෂ වාසිය, නිරපේක්ෂ වාසිය සහ තරඟකාරීත්වයේ වාසිය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii) "භාණ්ඩ වෙළඳ අනුපාතය වාසිදායක වුවද ආදායම් වෙළඳ අනුපාතය අවාසිදායක විය" මෙය සිදුවිය හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළදාමේ දිශානතියට අනුව ඇමරිකාව වැදගත් ආර්ථිකයකි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළදාමට අදාළව ආනයන හා අපනයන මූලාශ්‍ර පදනම් කර ගනිමින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 4)

(iv) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය සම්බන්දයෙන් පහත සඳහන් ගනුදෙනු සඳහා අදාළ ගිණුම්වල නම් සහ ද්විත්ව සටහන් ලියන්න.

(අ) දිවිවා ව්‍යසනය වෙනුවෙන් ශ්‍රීලංකාවට ආධාර ලෙස භාණ්ඩ තොග ලැබීම.

(ආ) ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීම.

(ඇ) ශ්‍රී ලංකාවේ ඩොලර් සංචිත භාවිතා කරමින් මූල්‍යමය රන් මිලදී ගැනීම.

(ඈ) ඊශ්‍රායෙලයේ සේවය කරන නිමල් ඔහුගේ වැටුප ශ්‍රී ලංකාවේ වෙසෙන තම මවට එවීම. (ලකුණු 4)

(v) "මැද පෙරදිග පවතින යුධ තත්වය හේතුවෙන් බොරතෙල් මිල ඉහළ ගොස් ඇත." මෙය රුපියලේ විදේශ අගයට සිදු කරන බලපෑම ප්‍රස්ථාර ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

9. (i) "ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මක සංකල්පයක් වන අතර ආර්ථික සංවර්ධනය ගුණාත්මක සංකල්පයකි."

පහදන්න. (ලකුණු 4)

(ii) "තිරසාර සංවර්ධනය" සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ආර්ථික වර්ධනයේ පිරිවැය සඳහන් කරන්න. (ලකුණු 4)

(iv) මානව සංවර්ධන දර්ශකයේ ශක්තීන් නම් කරන්න. (ලකුණු 4)

(v) දුගීබව තුරන් කිරීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටළු කවරේද? (ලකුණු 4)

10. (i) ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන් පොසිල ඉන්ධන මූලාශ්‍රවල සිට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර දක්වා යොමු වීමේ ආර්ථික ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 4)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලිය සඳහා වර්තමානයේ පවතින මැදපෙරදිග යුද්ධමය තත්වය කරනු ලබන ආර්ථික බලපෑම් කවරේද? (ලකුණු 5)

(iii) "මෑත කාලයේදී රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යඵලවල ධනාත්මක නැඹුරුවක් ඇත." ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් සඳහා ඇති පොදු විවේචන මොනවාද? (ලකුණු 5)

(iv) පසුගිය වසර කිහිපයේදී ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ඉහළ ගොස් ඇත.

(අ) රටක විදේශ විනිමය සංචිත යනු මොනවාද? (ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිතවල සංයුතිය දක්වන්න. (ලකුණු 2)

(ඇ) ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි විදේශ විනිමය සංචිතවල වැඩිවීම කරනු ලබන ධනාත්මක බලපෑම් මොනවා ද? (ලකුණු 3)